www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ රැස්වීම් මාලාවක්

# ලියොන් ට්‍රොට්ස්කි ඝාතනයෙන් 70 වසරක්: ඉතිහාසයේ පුනරාගමනය සහ ලෝක විප්ලවයේ මූලෝපාය

**Seventy years since the assassination of Leon Trotsky: The return of history and the strategy of the world revolution**

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව) විසිනි**

**2010 සැප්තැම්බර් 01**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානය, ලියොන් ට්‍රොට්ස්කිගේ ඓතිහාසික උරුමය සහ ලෝක සමාජවාදී විප්ලවය සඳහා අද ගෙන යන අරගලයට එහි පවත්නා අදාලත්වය පිලිබඳව ශ්‍රී ලංකාව තුල ප්‍රසිද්ධ රැස්වීම් මාලාවක් පවත්වනු ඇත.

ට්‍රොට්ස්කි, ලෙනින් සමග එක්ව 1917 රුසියානු විප්ලවයට නායකත්වය දුන් අතර ප්‍රථම කම්කරු රාජ්‍යය ආරක්ෂා කල රතු හමුදාව ද මෙහෙයවීය. ලෙනින්ගේ අභාවයෙන් පසුව, ඔහු සෝවියට් රාජ්‍යයේ ස්ටැලින්වාදී පරිහානියට එරෙහි අරගලයට දේශපාලනික හා න්‍යායික නායකත්වය සැපයීය. ස්ටැලින්ගේ පාවාදීම 1933 දී හිට්ලර් බලයට පැමිනීමට මගපෑදීමෙන් පසුව, තුන් වන ජාත්‍යන්තරය මියගොස් ඇති බව නිගමනය කල ට්‍රොට්ස්කි හතර වන ජාත්‍යන්තර ගොඩනැගීම සඳහා කැඳවුම් කල අතර ඔහු 1938 දී එය පිහිටුවීය.

ස්ටැලින්වාදී ඒජන්තයකු විසින් 1940 අගෝස්තු 21 දා මෙක්සිකෝවේ කොයොවාකාන්හි දී ට්‍රොට්ස්කි ඝාතනය කරන ලදි. ඔහුගේ ඝාතනය, ඔක්තෝබර් විප්ලවය සිදු කල සමස්ත පරම්පරාවේ ම අගනා ම නියෝජිතයන් ශාරීරිකව තුරන් කර දැමූ ස්ටැලින්ගේ විරේක කිරීම්වල කූඨප්‍රාප්තිය විය.

ට්‍රොට්ස්කිගේ ජීවිතය හා මෙහෙය ප්‍රගාඪ සමකාලීන අර්ථභාරයක් දරයි. ගෝලීය ලාභ ගරන ක්‍රමය, යලිත් වරක්, අතිමූලික ආර්ථික හා දේශපාලන අර්බුදයක ගිලී තිබේ. ට්‍රොට්ස්කිගේ අරගලය පිලිබඳ පාඩම්, ධනවාදය අහෝසි කොට ලෝක පරිමානව සැලසුම්ගත සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීම පිනිස කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම සඳහා අත්‍යවශ්‍ය දේශපාලන අවි සම්පාදනය කරයි.

කල්පසුවූ ධනවාදී වර්ධනයක් සහිත රටවල, ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ටසම්පන්න ජීවන මට්ටම් සඳහා වැඩ කරන ජනතාවට පවතින අභිලාෂයන් සපුරාලීමට ධනේශ්වරය දක්වා ඇති අපොහොසත්කම මගින්, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය නැවතනැවතත් සනාථ වී තිබේ. ශ්‍රී ලංකාවේ සියවස් කාර්තුවක් තිස්සේ පැවැති සිවිල් යුද්ධය ඒ සඳහා ඛේදනීය නිදසුනකි.

යුද්ධයට, පීඩනයට හා දරිද්‍රතාවට විරුද්ධ වීමේ මගක් සොයමින් සිටින කම්කරුවන්ට, ගෘහනියන්ට, තරුනයන්ට හා බුද්ධිමතුන්ට අපගේ ප්‍රසිද්ධ රැස්වීම්වලට පැමිනෙන ලෙස අපි උනුසුම්ව ආරාධනය කරමු.

## මහනුවර

**ස්ථානය: ජනමැඳුර ශාලාව**

**දිනය හා වේලාව: සැප්තැම්බර් 23 සවස 3.00**

## යාපනය

**ස්ථානය: සමූපකාර ශාලාව**

**දිනය හා වේලාව: සැප්තැම්බර් 26 සවස 2.00**

## කොළඹ

**ස්ථානය: නව නගර ශාලාව**

**දිනය හා වේලාව: ඔක්තෝබර් 10 සවස 3.00**

**ප්‍රධාන කතික:**

**සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්**

© www.wsws.org